# කිසිම විදේශ රටකින් මට මුදල් ලැබෙන්නේ නැහැ



ජාතික ජනබලවේගයේ නායක අනුර කුමාර දිසානායක

සාකච්ඡාව: **අජිත් සිරිවර්ධන** (Daily Mirror)
පරිවර්තනය: **කෝවිද ගුණසේකර** (ලංකාදීප)

ජාතික ජන බලවේගයේ නායකයා වන අනුර කුමාර දිසානායක සැප්තැම්බරයේ පැවැත්වෙන ජනපතිවරණයට ඉදිරිපත්වන අපේක්ෂකයෙකි. තමා ජනපතිවරණය ජයග්‍රහණය කළහොත් කිසිවෙකුගෙන්වත් දේශපාලනමය වශයෙන් පළිනොගන්නා බවත්, ඒ වෙනුවට ශ්‍රී ලංකාව ආර්ථික ආගාධයකට තල්ලු කිරීමට හේතු වූ දූෂණ සම්බන්ධයෙන් යුක්තිය ඉටුවන බව සහතික කරන බවත් ඩේලිමිරර් හා විශේෂ සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් ඔහු කියා සිටියේ ය. සිය ගමන් වියදම් ගැනත් අදහස් දැක්වූ ඔහු, මෑතකදී සහභාගී වූ ඉන්දියා සහ චීන සංචාරයන්ගේ සියලු වියදම් දැරූයේ එම රටවල රජයන් යැයි පැවසුවේ ය. වෙනත් රටවල යෙදුණු සංචාරයන්ගේ වියදම් දැරූයේ සිය පක්ෂය හා සම්බන්ධව සිටින සංක්‍රමණික ශ්‍රමිකයන් බවත් ජාතික ජන බලවේගයේ නායකයා කීවේ ය.

පහත ඇත්තේ ඔහු සමග කළ සම්මුඛ සාකච්ඡාව යි.

**ප්‍රශ්නය - මම ඔබ සමග මෙතැන ඉඳගෙන ඉන්නේ රටට නායකත්වය දී, බලාපොරොත්තු වන වෙනස උදාකර දිය හැකිදැයි ජනතාව ඔබගෙන් විමසින් සිටින වෙලාවක. ඔබ 2019 ජනපතිවරණයට තරග කළා. නමුත් ජයග්‍රහණය කරන්නට බැරි වුණා. එහෙම තත්ත්වයක මෙවර ජනපතිවරණය ජයග්‍රහණය කළ හැකි බවට ඔබ දැඩි විශ්වාසයක් ඇතිව ඉන්නේ කොහොම ද?**

මෙහෙමයි, අපේ රටේ දේශපාලනමය පරිවර්තනයක් වෙන්න නම් කාරණා දෙකක් සම්පූර්ණ විය යුතුයි. පළමුවැන්න තමයි තමන්ගේ සුපුරුදු පාලන ක්‍රමය යටතේ පාලකයින්ට රට තවදුරටත් ඉදිරියට ගෙනියන්න බැරි තත්ත්වයක් ඉස්මතු වීම. එවන් තත්ත්වයක් අද ඉස්මතු වෙලා තියෙන්නේ. ජනතාවට තමන්ගේ ජීවිතය සාමාන්‍ය පරිදි ගෙනියන්නට බැරි තත්ත්වයක් නිර්මාණය වීම තමයි දෙවැන්න. වර්තමානයේ, මේ කාරණා දෙකම පවතිනවා. අපේ රට වෙනම මාවතක ගෙනයා යුතු තත්ත්වයක් උද්ගත වෙලා තියෙනවා.

පසුගිය වසර කිහිපය පුරාවට එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක විදිහට, ඔවුන්ගේ තනි අනන්‍යතා ඇතිව ක්‍රියාත්මක වෙමින් හිටියා.

නමුත් මෑත අතීතය බැලුවහම ඔප්පු වෙනවා මේ පක්ෂ දෙක, දේශපාලන සංස්කෘතිය අතින්, ආර්ථික ප්‍රතිපත්ති අතින් සහ රට දණ ගැස්වීම අතින් කඳවුරු දෙකක් නියෝජනය නොකරන බව. ජනතාව මේක හොඳටම දන්නවා. ඒ වගේම තුන්වෙනුව මේ නායකයින් දැන් වයසයි. ඔවුන් නව ලෝකය සමග ඉදිරියට යන බවක් පෙනෙන්නට නැහැ. අනෙක් පැත්තෙන් ජනතාව දැන් වෙනදාට වඩා ගොඩක් සක්‍රීය යි. තුනෙන් දෙකක බලයක් තිබුණු විධායක ජනපතිවරයෙක් බලයෙන් පහකරපු ජනතාවක් අපට සිටින්නේ. මේ වතාවේ ජනතාව නගමින් සිටින හඬ සහ ඔවුන්ගේ බලාපොරොත්තු, වසර ගණනාවක් පුරාවට අප පෙනී සිටි සහ දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි ඉදිරියට ගෙන එන දේවල්ම යි. ඒ නිසා, අපිට ජයග්‍රහණය කරන්න පුළුවන්.

**ප්‍රශ්නය - නමුත් 2019 වසරේ පැවැති අවසන් ජනපතිවරණයේ දී, ඔබට දිනාගන්නට පුළුවන් වුනේ ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 3%ක් පමණයි. ජනපතිවරණයක් ජයග්‍රහණය කරන්න නම් අඩුම තරමින් ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 50%ක් හෝ වැඩි ප්‍රතිශතයක් දිනාගැනීමට අවශ්‍යම යි. එහෙම බලපුවහම සියයට 3 සියයට 50 වෙනකන් වැඩි කරගන්න නම් ප්‍රාතිහාර්යයක්ම වෙන්න ඕන. ඔබ කොහොමද ඒක කරන්න යන්නේ?**

2015 වසරේ පැවැත්වුණු පාර්ලිමේන්තු මැතිවරණයෙන් බහුතරය දිනාගත්තු රනිල් වික්‍රමසිංහට 2020 මැතිවරණයේ දී, එකම එක ආසනයක්වත් දිනාගන්න බැරි වුණා. පහුගිය ජනපතිවරණයේ දී, ලක්ෂ 69ක් ඡන්ද ලබාගත්තු, ඊළගට පැවැත්වුණු පාර්ලිමේන්තු මැතිවරණයෙන් තුනෙන් දෙකක බහුතරයකුත් දිනාගත්තු ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුවට අවුරුදු දෙක හමාරකට වැඩිය බලයේ ඉන්න බැරි වුණා. 2019 සහ 2020 වසරවල ඉතාම බලවත් දේශපාලන බලවේගයක් වුණු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අපේක්ෂකයෙක්වත් ඉදිරිපත් කරන්න බැරි තත්ත්වයකට සෝදාපාළු වෙලා ගිහින්. දේශපාලනය කියන්නේ ගණිතයෙන් මනින්න පුළුවන් දෙයක් නොවන බවයි මේ දේවල්වලින් ඔප්පු වෙන්නේ. දේශපාලනය කියන්නේ සමාජමය දෙයක්. ඒ වගේම තමයි දේශපාලන වෙනස්කම් ක්‍රම ක්‍රමයෙන් සිදුවෙන ඒවා නෙවෙයි. ඒවා හරියට උඩ පනිනවා වගේ ක්ෂණිකව සිදුවෙන ඒවා. ඉතින්, අපට ජගග්‍රහණය කළ නොහැකිය කියා ඔබ සිතන්නේ ඇයි?

**ප්‍රශ්නය - ඔබ පැවත ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණේ පසුබිමකින්. ජනතා විමුක්ති පෙරමුණ පැවත එන්නේ ඉතාම ආන්දෝලනාත්මක පසුබිමකින්. 1988/89 කෝලහාල ජනතාවට තවමත් මතකයි. ඔබ බලයට ආවොත් ඒ සංස්කෘතියත් අරගෙනම ඒවිය කියා බයක් ඇතැම් අයට තිබෙනවා. තත්ත්වය එහෙම නම්, ඔබ දැන් වෙනස් බව ඔබ සහතික කරන්නේ කොහොම ද?**

එක දෙයක් තමයි, 1988 සහ 89 සිදුවීම් ඉබේ පහළ වූ සිදුවීම් නොවීම. ඒවා එක්තරා දේශපාලන ගමනක නිර්මිතයන්. 1978 වසරේ අතුරු මැතිවරණයක් පැවැත්වුණා මැතිවරණ කොට්ඨාස 4ක. අපි ඒ මැතිවරණයට ප්‍රජාතාන්ත්‍රිකව තරග කළා. 1981 වසරේ පැවැත්වුණු සංවර්ධන කවුන්සිල මැතිවරණයටත් අපි තරග කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒ මැතිවරණය වර්ජනය කළ පසුබිමක. 1982 ජනපතිවරණයත් අපි තරග කළා. ජනමත විචාරණයක් හරහා පළාත් සභා මැතිවරණ කල්දැමීමට එරෙහිව අපි නැගී සිටියා. ඒ නිසා, අපි හැම අවස්ථාවකම ඉතාම ස්ථිරසාරවම ගමන් කරලා තියෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී මාවතක. අපිට හැංගෙන්න කිසිම හේතුවක් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදයෙන් බැහැර වෙලා කැලෑ දේශපාලනය කරපු දේශපාලන බලවේගයක් නෙවෙයි අපි. නමුත් 1983 වසරේ එවක හිටපු ආණ්ඩුවම කලු ජූලිය නිර්මාණය කළා. කලු ජූලිය දඩමීමා කරගෙන අපිව තහනම් කළා. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරලා අපේ වෘත්තිය සමිතිත් තහනම් කළා.

අපිට තිබුණේ විකල්ප දෙකයි. එකක් දේශපාලනය අත්හැරීම නැතිනම් දේශපාලන දිගටම කරගෙන යාම. තහනම තිබුණත් අපි දේශපාලනය දිගටම කරගෙන යාම තෝරාගත්තා. එයින් පස්සේ තත්ත්වය සිවිල් යුද්දයක් වෙනකන්ම දරුණු වුණා. අපි නොකළ යුතුව තිබුණු දේවල් මේ කාලවකවානුවේ අපි කළා. ඒ දේවල් ගැන කම්පනය සහ කණගාටුව අපි දැනටමත් පළකරලා තිබෙනවා. නමුත් ඒ අපේ වචන නෙවෙයි. අපි නැවතත් දේශපාලන වේදිකාවට ආවේ 1994 වසරේ දී.

1994 වසරේ සිට ගෙවුණු පසුගිය වසර 30ක කාලට පුරාවට පැවැත්වුණු සෑම මැතිවරණයකටම අපි තරග කර තිබෙනවා. දේශපාලනමය වශයෙන් අපිට අවාසි

☞